| අනුහුරු ප්‍රශ්න පත්‍රයකි | කාලය<br>පැය 1 වි.30 යි |
|---|---|
| **සිංහල** | **4 ශ්‍රේණිය** |

**නම: ...............................................................**

01. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය තෝරන්න.

   i. විශේස / විශේෂ / විෂේෂ
   ii. සමස්ත / සමස්ථ / ශමස්ථ
   iii. විශිෂ්ඨ / විශිස්ට / විෂිශිය
   iv. ත්‍යාග ප්‍රධානය / ත්‍යාග ප්‍රදානය / ත්‍යාග ප්‍රදාණය
   v. ළමා නිර්මාන / ළමා නිර්මාණ / ළමා නිර්මාණ

(ලකුණු 05)

02. පහත සඳහන් ප්‍රකාශයන් ඇතුලත් පාඩමේ නම, කීවේ කවුද?, කීවේ කාටදැයි ලියන්න.

   i. ''අපි අර ඔයේ ඉවුරට ගොඩ වෙමු''

   1. පාඩමේ නම : ......................................................
   2. කීවේ කවුද : ......................................................
   3. කීවේ කාටද : ......................................................

   ii. ''මම මේකට පයින් ගහලා විසි කළේ'' ...

   1. පාඩමේ නම : ......................................................
   2. කීවේ කවුද : ......................................................
   3. කීවේ කාටද : ......................................................

   iii. ''අහු වුණා අහු වුණා
   අන්තිමේ අහු වුණා
   දැන් ඉතින් තේ ගණන
   තමුසේම ගෙවනවා....... ''

   1. පාඩමේ නම : ......................................................
   2. කීවේ කවුද : ......................................................
   3. කීවේ කාටද : ......................................................

(ලකුණු 09)

03. පහත දැක්වෙන අකුරු වලට යොදා ඇති පිල්ලමේ නම ලියන්න.

1. පි - ......................  4. ශ්‍ර - ......................  7. දී - ......................

2. කැ - ....................  5. ළු - .....................  8. රා - ......................

3. සු - ......................  6. ක් - ......................  9. රූ - ......................

10. තු - .................  (ලකුණු 10)

04. කවිය කියවා පිළිතුරු ලියන්න.

ගොඩ මඩ දෙකම සරු සාරය පලබර ය
කටුරොද ගම්මාන තරමක පිටිසර ය
ඒ ගම මැදින් ගලනා ගඟ මනහර ය
කඩ මණ්ඩිය පිහිටියේ ගම කෙළවර ය

i. කවියෙන් කියැවෙන්නේ කුමන අන්දමේ ගමක් පිළිබඳවද?
ii. ගම මැදින් ගලා යන්නේ කුමක්ද?
iii. ගම කෙළවර පිහිටියේ කුමක්ද?
iv. යුගල පදයක් ලියන්න.

(ලකුණු 2×4=08)

v. සමාන පද ලියන්න.

1. ගඟ - ...................................................................................................

2. මනහර - ...................................................................................................

3. සරුසාර - ...................................................................................................

(ලකුණු 1×3=03)
(ලකුණු 11)

05. පහත දැක්වෙන සිද්ධිය නිවැරදි අනුපිළිවෙලට ගලපා ලියන්න.

i. හෝ.............. හෝ .............. ශබ්දය ඇතින් ඇසුනි.
ii. අහස වැහි වළාකුලකින් බර විය.
iii. තාත්තා කුඹුරේ සිට ඉක්මනින් ගෙදර ආවේය.
iv. තද සුළඟින් ගස් වැල් ඇඹරෙන්නට විය.
v. වැහි බිඳු වේගයෙන් බිමට වැටුනි. (ලකුණු 10)

06. ඔබේ පෙළ පොතේ පාඩම් කීපයක වචන පහත දැක්වේ. ඒවායේ අදහස ඔබේ වචනයෙන් ලියන්න.

i. නිල්ල ගැසී ඇත - ...................................................................................................
ii. පිපෙන සුදු පෙණ - ...................................................................................................
iii. පවුරක් සේ - ...................................................................................................
iv. කතාව ගමනට ඉනිමගක් නොවූ -...................................................................................................
v. රස පල හිනැහෙන්නේ - ...................................................................................................(ලකුණු 10)

07. පහත දැක්වෙන වාක්‍ය ලිඛිත භාෂාවෙන් ලියන්න

i. මම සෙල්ලම් කරනවා - ..........................................................................................................

ii. අපි විනෝද ගමනක් යනවා - ..............................................................................................

iii. අම්මා ළිඳට යනවා - .........................................................................................................

iv. ගොවියා කුඹුර කොටනවා - ..................................................................................................

v. සෙබළු සටන් කරනවා - .......................................................................................................

(ලකුණු 15)

08. උපමා සහ උපමේයයන් ගලපා යා කරන්න.

| | |
|---|---|
| i. කඳු වැටිය | තපස් රැකීම |
| ii. නිහඬව සිටීම | ආරක්ෂිත පවුර |
| iii. ශ්‍රී ලංකාව | තෝමස් අල්වා එඩිසන් |
| iv. මායාකරුවෙකු | දිව්‍ය ලෝකය |

(ලකුණු 08)

09. සුදුසු විරාම ලකුණු යොදන්න.

i. ගුරුවරු අකුරු උගන්වති

ii. ඔබ පමා වුයේ ඇයි

iii. අනේ දෙවිදත් නොදිටි මොක්පුර

iv. අම්මේ මම නිදා ගන්නද

v. කුමාරතුංග මුනිදාස මහතා හීන්සැරය මගුල්කෑම හත්පණ වැනි ළමා කථා ලියා ඇත

(ලකුණු 10)

10. පහත දැක්වෙන මාතෘකා වලින් එකක් තෝරා ගෙන රචනයක් ලියන්න. (අර්ථවත් වාක්‍ය 07 ක් ලියන්න.)

i. ගස්වැල් අපේ මිතුරෝය

ii. බක්මහ අසිරිය

iii. කුරුල්ලෙක් කථා කරයි

iv. මගේ ගම

(ලකුණු 12)